# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1849/32 - 2014 පෙබරවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2014.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති හා නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් කොටස් කෑගල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පින්නවල අලි අනාථාගාරය අසල වාහන නැවතුම්පලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පින්නවල ගමේ පිහිටියාවූ ද, බලයලත් මිනින්දෝරු පී. එම්. සුනිල් මහතා විසින් මැන පිළියෙල කරන ලද 2013.10.05 දිනැති පිඹුරු අංක 2354හි කැබලි අංක 1, 2, 3 සහ 5න් නිරූපිත ප්‍රමාණයෙන් හෙක්. 1.0816 (අක්. 2, රූඩ් 2, පර්. 27.60) ක් පමණ විශාල වූ කොටකුඹුර හා පලිගලේ කුඹුර නමැති ඉඩම් කොටස් වලට මායිම් පහත පරිදි වේ :

**කැබලි අංක : 1 - විශාලත්වයෙන් හෙක්. 0.6302 (අක්කර 1, රූඩ් 2, පර්. 09.15)ක් පමණ වූ කොට කුඹුර නමැති ඉඩම.**

| | |
|---|---|
| උතුරට | : ඇළ ; |
| නැගෙනහිරට | : කෑගල්ල රඹුක්කන පාර ; |
| දකුණට | : කැබලි අංක 3 සහ 4 ; |
| බටහිරට | : කැබලි අංක 2. |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

**කැබලි අංක : 2 - විශාලත්වයෙන් හෙක්. 0.3114 (අක්කර 0, රූඩ් 3, පර්. 03.10)ක් පමණ වූ පලිගලේ කුඹුර නැමති ඉඩම.**

උතුරට : ඇළ ;
නැගෙනහිරට : කැබලි අංක 1, 3, 4 සහ 5 ;
දකුණට : කැබලි අංක 5 සහ අලි අනාථාගාර නිල නිවාස පිහිටි ඉඩම ;
බටහිරට : පලිගලේ කුඹුර.

**කැබලි අංක : 3 - විශාලත්වයෙන් හෙක්. 0.0804 (අක්කර 0, රූඩ් 0, පර්. 31.80)ක් පමණ වූ නම සොයාගත නොහැකි ඉඩම.**

උතුරට : කැබලි අංක 1 ;
නැගෙනහිරට : කැබලි අංක 4 ;
දකුණට : කැබලි අංක 4 ;
බටහිරට : කැබලි අංක 5 සහ 2.

**කැබලි අංක : 5 - විශාලත්වයෙන් හෙක්. 0.0596 (අක්කර 0, රූඩ් 0, පර්. 23.55)ක් පමණ වූ නම සොයාගත නොහැකි ඉඩම.**

උතුරට : කැබලි අංක 2 සහ 3 ;
නැගෙනහිරට : කැබලි අංක 4 සහ අලි අනාථාගාර නිල නිවාස පිහිටි ඉඩම ;
දකුණට : අලි අනාථාගාර නිල නිවස පිහිටි ඉඩම ;
බටහිරට : කැබලි අංක 2.

02-879

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.